# 13. සුර ලොවේ සුර පියේ

ජේසුතුමා දිනපතා ම දෙවි පියාට ආදරෙන් කතා කළා. ගෝලයන්ටත් ජේසුතුමා වාගේ දෙවි පියාට කතා කරන්න ආසා හිතුණා. දවසක් ජේසුතුමා ගෝලයන්ට දෙවි පියාට කතා කරන හැටි කියා දුන්නා. හරි ම ලස්සනයි.



'ස්වර්ගයෙහි වැඩ සිටින අපගේ පියාණෙනි,
ඔබගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා!
ඔබගේ රාජ්‍යය පැමිණේවා
ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් මෙලොවෙහි ද
ඉටු වේවා!

අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව.
අපට වැරදි කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන්
අපගේ වැරදි ද කමා කළ මැනව.
පාප අවස්ථාවන්ට අසු වීමට අපට ඉඩ නොදී අයහපතින්
අප මුදා ගත මැනව.



## පැවරුම්

1. මෙම පාඩමේ හමු වන යාච්ඤාව අභ්‍යාස පොතෙහි ලියන්න.
2. මෙම පාඩමෙහි ඇති යාච්ඤාව මඟින් දෙවි පියාට දිනපතා කතා කිරීමට පුරුදු වන්න.